# සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම - 2010

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා තබා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය මත ගෙවා තිබූ එකතුව රු.7,382,051 ක් වූ පොළී මුදල් ශේෂ පත්‍රයේ ඉඩම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුම් වලට සංවර්ධන ව්‍යාපෘති වියදම් ගිණුම් ගත කිරීමේ දී ව්‍යාපෘති වලට අදාල වියදම් පිළිබඳ අවධානය යොමු නොකර එකතුව රු.13,562,314 ක් වූ පහත සඳහන් වියදම් ගිණුම් ගත කර තිබුණු බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. මේ නිසා එක් එක්

ස්ථාවර වත්කම් ගිණුමෙන් පෙන්නුම් කරන වටිනාකම් වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සැහීමකට පත්විය නොහැකි විය.

| **ස්ථාවර වත්කම්** | **වියදම් විෂයය** | **මුදල රු.** |
|---|---|---|
| ඉඩම් | රුදුගු වත්තට විදුලිය සැපයීම | 119,970 |
| | අපවිත්‍ර ජලය බැහැර හැරීමේ පද්ධතිය | 8,236,915 |
| ගොඩනැගිලි | උපයෝජනය නොකල අරමුදල් වැඩ | 2,561,145 |
| | දෛනික වැඩ සඳහා බුල්ඩෝසර් කුලියට ගැනීම | 146,988 |
| | පුහුණු හා නුපුහුණු රියදුරු වැටුප් | 122,338 |
| | ට්‍රක් සහ විදුලියජනක යන්ත්‍ර කුලියට ගැනීම | 293,976 |
| | පාෂාණ පරීක්ෂාව | 1,041,232 |
| | ඉඩම් සැකසීම | 1,039,750 |
| | | 13,562,314 |

### 1.2.2 <u>නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | **නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව** | **විස්තරය** |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා නොගෙන භාණ්ඩාගාර අරමුදල් වලින් රු.108,000,000 ක් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9 වගන්තිය | මත්තල ගුවන් තොටුපල ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වී අමාත්‍ය මණ්ඩලය නම්කළ කොන්ත්‍රාත්කරුට භාරදීමට අනුමත කර තිබියදී ඒ පිලිබඳව මිල එකඟතා සාකච්ඡාවකට යෙදුනු නිලධාරීන්ගෙන් නිලධාරීන් 25 දෙනෙකුට ප්‍රසම්පාදන කමිටු දීමනා ලෙස රු.237,500 ගෙවා තිබුණි. |

1.2.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

පහත දැක්වෙන ගිණුම් විෂයයන් එම විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| | **විස්තරය** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ ලියවිලි** |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | "සූර්ය මංගල්‍ය" වියදම | 500,000 | සිදුකළ ප්‍රචාරණ වැඩ පැවැත් වූ දිනයන්, වැඩ සටහන් විස්තර සහ වියදම් විස්තර, සංයුක්ත තැටි ආදිය |
| (ආ) | අන්දර වැව සිට පහළ මත්තලට මාර්ගයක් ඉදිකිරීම | 28,800,000 | සහතික කළ වැඩ සහතිකපත් සමඟ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලිපි ගොනුව |
| (ඇ) | ගුවන් ගමන් ගාස්තු | 308,635 | විදේශීය සංචාරයෙන් පසු ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ඩුබායි ගුවන් තොටුපලේ බදු නිදහස් සාප්පු සංකීර්ණ පිලිබඳ විශේෂ අධ්‍යයන වාර්තාව |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය සම්බන්ධයෙන් වූ මෙහෙයුම්වලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,037,743 ක ශුද්ධ ඌනතාවයක් විය. ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,194,308 ක ශුද්ධ අතිරික්තයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,232,051 ක පිරිහිමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 මතභේදයට තුඩුදෙන ගනදෙනු

පහත සඳහන් ඉදිකිරීම් සහ සවිකිරීම් වැඩ පිරිවිතරයන්ට අනුව සම්පූර්ණ කර නොතිබුණ ද අවසාන ගෙවීම් සහ රඳවාගත් මුදල් සම්පූර්ණයෙන්ම අදාල කොන්ත්‍රාත්කරුට 2006 වර්ෂය තුල දී ගෙවා තිබුණි. එසේ වුවද ඉංජනේරුවරයාගේ ව්‍යාපෘති සමාප්ති වාර්තාව (Engineer's Project Completion Report) නිකුත් කරන ලද්දේ 2007 ජුලි මාසයේ දීය.

| ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් වටිනාකම | | සහතික කර ගෙවා තිබූ වටිනාකම | |
|---|---|---|---|---|
| | විදේශීය<br>රු. | දේශීය<br>රු. | විදේශය<br>රු. | දේශීය<br>රු. |
| මගී පර්යන්ත ගොඩනැගිල්ල B -1 | 5,042,624,067 | 1,968,670,442 | 5,042,624,067 | 1,968,670,442 |
| සිවිල් හා උපයෝගිතා වැඩ A | 1,176,308,721 | 567,374,104 | 1,176,308,721 | 567,374,104 |

ඒ අනුව ඉහත කොන්ත්‍රාත්තුවලට අදාල සියළුම ගෙවීම් සහ රඳවා ගැනීම් මුදල් නිදහස් කර තිබියදීත් කොන්ත්‍රාත් වලට අදාලව පහත සඳහන් රේගු ගාස්තු සහ උපයනවිට ගෙවීමේ බදු සඳහා අන්තර් ගෙවීම් සහතික පත්‍ර මත සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කර තිබුණි.

| ව්‍යාපෘතියේ නම | අන්තර් ගෙවීම් සහතිකය | ඉල්ලා තිබූ මුදල රු. | ගෙවීම් කල මුදල රු. |
|---|---|---|---|
| සිවිල් හා උපයෝගිතා වැඩ A | A -36 | 7,131,649 | 7,131,649 |
| මගී පර්යන්ත ගොඩනැගිල්ල B -1 | B -1 - 37 | 67,454,268 | 67,454,268 |
| | B -1 - 38 | 64,074,866 | 23,414,083 (අත්තිකාරම් මුදලකි) |
| | | | 98,000,000 |

ඒ අනුව කොන්ත්‍රාත්තුව නිම වී වර්ෂ 04 කින් පසුව 2007 වර්ෂයේ නිකුත් කර තිබූ අන්තර් ගෙවීම් සහතික පත්‍ර මත සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කිරීමට හේතු ඉදිරිපත් කර නොතිබීම නිසා ඒ මත කරන ලද ගෙවීම් වල නිරවද්‍යතාවය විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2.3 වත්කම් කළමනාකරණය

ගුවන් තොටුපල සංවර්ධන විශේෂ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ මුදල් වර්ෂයකට වැඩි කාලයක සිට සමාගමේ බැංකු ජංගම ගිණුම් 02 ක කිසිඳු කාර්යයකට නොයොදවා තිබූ බැවින් එම ගිණුම්වල පැවැති පහත සඳහන් මුදල් ශේෂ නිෂ්කාර්ය වත්කම් ලෙස නිරීක්ෂණය විය.

| ජංගම ගිණුම | ශේෂය රු. |
|---|---|
| ඒ | 19,526,750 |
| බී | 3,037,318 |

2.4 **<u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොර ගණුදෙනු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගීවන නිලධාරීන්ට නිශ්චිත දීමනාවක් හෝ ගමන් වියදම්, සංයුක්ත දීමනා හා හෝටල් බිල් ප්‍රතිපූර්ණය කිරීමේ වියදම් සීමාවක් නියම කර නොතිබූ බැවින් යැපීම් දීමනා ලෙස 2008, 2009 සහ 2010 වර්ෂ තුල එකතුව රු.9,235,012 ක් වූ ගමන් වියදම්, සංයුක්ත දීමනා හා හෝටල් බිල් ප්‍රතිපූර්ණය කිරීම් ලෙස භාණ්ඩාගාර අරමුදල් වලින් ගෙවා තිබුණි.

| <u>වර්ෂය</u> | <u>ප්‍රතිපූර්ණය කරන ලද සංයුක්ත දීමනා</u><br><u>රු.</u> |
|---|---|
| 2008 | 1,542,016 |
| 2009 | 3,700,514 |
| 2010 | 3,992,482 |
| | ------------- |
| | 9,235,012 |
| | ========= |

(ආ) රු.මිලියන 24,244 ක ඇස්තමේන්තු පිරිවැයකට මත්තල දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම් ව්‍යාපෘතියේ මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයක් ස්ථාපනය කර නොතිබූ අතර ව්‍යාපෘතයේ ඉදිකිරීම් කටයුතු වල වැඩ සහතික කිරීම් සඳහා වගකීම පැවරෙන පරිදි සුදුසු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත්කර නොතිබුණි.

2.5 **<u>ඉඩම් අත්පත් කර ගැනීම්</u>**

සමාගමේ විවිධ සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් විවිධ ප්‍රාදේශිය ලේකම්වරුන්ට 1997 සිට 2008 දක්වා අතර කාල පරිච්ඡේදය තුල ගෙවා තිබුණු එකතුව රු.33,813,795 ක් වූ පහත සඳහන් අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ද අත්තිකාරම් හා තැන්පතු යටතේ දක්වා තිබුණි.

| ගෙවූ දිනය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | මුදල |
|---|---|---|
| | | රු. |
| 1997 දෙසැම්බර් 31 | කටාන | 2,083,648 |
| 1998 දෙසැම්බර් 16 | ගම්පහ | 4,718,000 |
| 2000 ජුලි 18 | ගල්කිස්ස | 834,118 |
| 2008 පෙබරවාරි 12 | ගල්කිස්ස | 24,178,029 |
| 2008 පෙබරවාරි 22 | කටාන | 2,000,000 |
| | | 33,813,795 |

ඉඩම් අත්පත් කර ගැනීමේ සහ අත්තිකාරම් මුදල නිරවුල් කර ගැනීමේ ක්‍රියාවලියේ කාල ප්‍රමාදය පිළිබඳව ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවේ ද පෙන්වා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුලදී ද අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්ගෙන් මුදල් ගෙවීම පිළිබඳ ප්‍රගති වාර්තා කැඳවීමට සහ අත්තිකාරම් නිරවුල් කිරිම හා ඉඩම් අත්පත් කර ගැනීම් අධීක්ෂණය සඳහා කටයුතු කර නොතිබුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ඉඩම් අත්පත් කර ගැනීම්

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) රේගු ගාස්තු සහ බදු ප්‍රතිපූර්ණය